සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2017 ජනවාරි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2017-01-21
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව නීති සෑදීමේ බලය ඇත්තේ කුමන ආයතනයට ද?

(1) මහේස්ත්‍රාත් අධිකරණය. (2) ශ්‍රේෂ්ඨාධිකරණය.

(3) ප්‍රාදේශීය සභාව. (4) පාර්ලිමේන්තුව.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ උතුරේ යාපනය අර්ධද්වීපයේ දමිළ පදිංචිකරුවන්ට පමණක් අදාල වන නීතිය කුමක් ද?

(1) ඉංග්‍රීසි නීතිය. (2) උඩරට නීතිය.

(3) තේසවලාමේ නීතිය (Thesawalamai Law). (4) මුස්ලිම් නීතිය.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම පිළිබඳව රජයට උපදෙස් දීම.

(2) බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළ තුළ සුරැකුම්පත් නිකුත්කිරීම් හා ලැයිස්තුගත කිරීම් නියාමනය කිරීම.

(3) ලැයිස්තුගත කිරීමක් සඳහා ඉදිරිපත් කරන ලද යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීම සඳහා බලපත්‍රලාභී කොටස් හුවමාරුවක් මෙහෙයවීම.

(4) ව්‍යාපෘති යෝජනා ආයෝජකයන් සමග සාකච්ඡා (negotiate) කර ගැනීම.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිවිසුමක් අවසාන කිරීමේ (terminating) ක්‍රමයක් වන්නේ කුමක් ද?

(1) ඉටු කිරීම මගින් (By performance).
(2) ව්‍යර්ථ වීම මගින් (By frustration).
(3) උල්ලංඝණය කිරීම මගින් (By breach).
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ගැනුම්කරුවෙකුට තිබෙන ප්‍රතිකර්මයක් (remedy) වන්නේ කුමක් ද?

(1) ලියම (Lien).

(2) නැවත විකිණීම (Resale).

(3) සන්සරණයේදී නැවැත්වීම (Stoppage in transit).

(4) ගිවිසුම එලෙසම ඉටු කිරීමේ ආඥාවක් ලබා ගැනීම (Action for specific performance).

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක අත්‍යවශ්‍ය මූලිකාංගයක් (essential element) **නොවන්නේ** කුමක් ද?

(1) දේපළ පැවරීම (Transfer of property).
(2) භාණ්ඩ.
(3) ස්ථානය.
(4) මිල.

**1.7** භාණ්ඩ ලඟාවීමෙන් පසු ඒවාට හිමිකම් පෑම සඳහා ආනයනකරුවෙකුට (ගැනුම්කරුවෙකුට) අවශ්‍යවන ලියවිල්ල වන්නේ:

(1) නෞභාර පත (Bill of Lading).
(2) ණයවර ලිපිය (Letter of Credit).
(3) ප්‍රභවස්ථාන සහිතකය (Certificate of Origin).
(4) විනිමය බිල (Bill of Exchange).

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.8** 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ හඳුනාගෙන ඇති බුද්ධිමය දේපළ වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

**1.9** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කල්බදු වර්ග (types of leases) දෙකක්(02) සඳහන් කරන්න.

**1.10** 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ සේවකයන් හිමිකම් ලබන නිවාඩු වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

## **B කොටස**

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### **02** වන ප්‍රශ්නය

**සුනිමල්** 2005 වර්ෂයේ සිට පකිස්තානයෙන් සීනි ආනයනයකොට කොළඹ නගරයේ තොග වෙළෙන්දන්ට විකිණීම සිදු කරයි. සීනි ශ්‍රී ලංකාවට පැටවීමට පෙර **සුනිමල්** පකිස්තානු සැපයුම්කරුවන් හට අත්තිකාරම් ගෙවීම සිදු කරයි. ඔහුට ගෙවීම් සිදුකිරීමේ ක්‍රමය, ණයවර ලිපි (letter of credit) ක්‍රමයට වෙනස් කිරීමට අවශ්‍යව තිබේ.

ණයවර ලිපි ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි **සුනිමල්** ට **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### **03** වන ප්‍රශ්නය

*"ගනුදෙනු කළ නොහැක"* (*Not Negotiable*) යනුවෙන් රේඛනය කර තිබූ **B** ට අයිති චෙක්පත **A** විසින් සොරකම් කර, **D** ට ගෙවිය යුතුව තිබූ ගණනක් පියවීම සඳහා ඔහු විසින් **D** ට දෙන ලදී. සොරකම් කරන ලද එකක් බව නොදැන **D** විසින් එය බාර ගත්තා ලද අතර එය ඔහුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම චෙක්පතේ සඳහන් මුදලට හිමිකම් පෑමට **D** ට හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### **04** වන ප්‍රශ්නය

තොරතුරු තාක්ෂණ සංවර්ධනය සමාජයේ බොහෝ උන්නතීන් වලට මඟපාදා ඇත. තවද, එය සමාජයේ බොහෝ සාපරාධී ක්‍රියාවන්ට (malpractices) ද හේතුකාරක වී ඇත. 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යනු පරිගණක අපරාධ වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ බලපැවැත්වෙන නෛතික ආඥාපනත් වලින් එකකි.

(a) 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යටතේ ආවරණය කෙරෙන වැරදි (offences) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) තොරතුරු සන්නිවේදන තාක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන වෙනත් නෛතික ආඥා පනත් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### **05** වන ප්‍රශ්නය

**PLN ඇසෝසියේට්ස්** ආයතනයේ ගණකාධිකාරීවරයෙකු වූ **ඩිලාන්** බහුජාතික සමාගමක සේවයට බැඳීම සඳහා 2016 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වනසේ සේවයෙන් ඉල්ලා අස්විය. සේවයෙන් අස්වූ දිනය වන විට ඔහු **PLN ඇසෝසියේට්ස්** ආයතනයේ වර්ෂ 10 ක සේවය සපුරා තිබුණි. 2016 දෙසැම්බර් මාසය සඳහා ඔහුගේ වැටුප රු.120,000/- ක් විය.

(a) සේවයෙන් අස්වන දිනට පාරිතෝෂික ගෙවීම් ලැබීමට හිමිකම් පෑම සඳහා සේවකයෙකු විසින් සපුරාලිය යුතු නිර්ණායකයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) **ඩිලාන්ට** පාරිතෝෂික ගෙවීම් ලැබීමට හිමිකම් ඇතැයි උපකල්පනය කරමින්, ඔහුට පාරිතෝෂික ලෙස ගෙවිය යුතු ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන අභ්‍යන්තර මෙන්ම බාහිර පාර්ශවයන්ගේ අයිතිය සුරුකෙන ආකාරයට කටයුතු කිරීම වෘත්තීය ගණකාධිකාරීවරයෙකුගේ වගකීම වන්නේය. පොදු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ගණකාධිකාරීවරයෙකු විසින් පිළිපැදිය යුතු මූලික වෘත්තීය ආචාරධර්ම වලින් එකක් වන්නේ ස්වාධීනත්වයයි (Independence).

මූලික වෘත්තීය ආචාරධර්මයක් ලෙස "ස්වාධීනත්වය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**.

(ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

(a) 2016 ජනවාරි 01 දින, **සපරමාදු** ඔහුගේ නිවස ගින්නෙන් ආරක්ෂා කර ගැනීම පිණිස **සීමාසහිත XYZ රක්ෂණ සමාගමෙන්** රු. මිලියන 3 ක රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. රක්ෂණ ආවරණය ලබාගැනීමෙන් පසු, 2016 මාර්තු 01 දින **සපරමාදු** රු. මිලියන 3 කට **පෙරේරා** ට ඔහුගේ නිවස විකුණන ලදී. 2016 මාර්තු 15 දින නිවස ගින්නෙන් විනාශ වූ අතර, 2016 මාර්තු 20 දින **සීමාසහිත XYZ රක්ෂණ සමාගම** රක්ෂණ ඔප්පුව යටතේ රු. මිලියන 3 ක් ගෙවීමට එකඟ විය. 2016 මාර්තු 30 දින, නිවස විකිණීම වෙනුවෙන් විකිණීමේ මුදල (sale proceed) වශයෙන් රු. මිලියන 3 ක් **පෙරේරාගෙන්**, **සපරමාදුට** ලැබුණේය.

රක්ෂණ ඔප්පුව යටතේ **සීමාසහිත XYZ රක්ෂණ සමාගමෙන්** වන්දි ලබා ගැනීමට **සපරමාදුට** හිමිකමක් තිබේදැයි **විමසන්න.** (ලකුණු 06)

(b) චෙක්පතක් ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් ලෙස පොදුවේ භාවිත වේ. සෑම චෙක්පතක්ම විනිමය බිල්පතක් වන නමුත්, සෑම විනිමය බිල්පතක්ම චෙක්පතක් නොවේ.

චෙක්පතක ලක්ෂණ (characteristics) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

කේවලස්වාමි ව්‍යාපාරිකයෙක් වන **අමින්ද** වර්ෂ 15 කට වඩා වැඩි කාලයක් තම ව්‍යාපාරය කරගෙන යයි. **අමින්ද** තම ව්‍යාපාරය වගකීම් සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට සැලසුම් කරමින් සිටී.

(a) තම ව්‍යාපාරය, වගකීම් සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට **අමින්ද** විසින් සපුරාලිය යුතු අවශ්‍යතාවයන් පිළිබඳව ඔහුට **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) වගකීම් සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ (features) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

**රෝස්, කුමාර්ගේ** නියෝජිතයා ලෙස ක්‍රියා කරනු ලබයි. නියෝජිතයා ලෙස ඇයගේ හැකියාව (capacity) මත, **කුමාර්** වෙනුවෙන් **සිල්වා** සමග අවුරුදු ගණනක් තිස්සේ **රෝස්** විසින් ගිවිසුම් කිහිපයකට එළඹෙන ලදී. **කුමාර්** වෙනුවෙන් **රෝස්** විසින් එළඹෙන ගිවිසුම් වලින් කිසියම් පාඩුවක් වෙතොත් **කුමාර්** විසින් ඒ සඳහා වන්දි ගෙවනු ලැබේ. පසුව, **කුමාර්** විසින් **රෝස්ගේ** නියෝජිතභාවය අවසන් කරන ලද නමුත් **සිල්වාට** ඒ පිළිබඳව දැනුම් දී නොතිබුණි. **රෝස්,** දිගින් දිගටම **කුමාර්** වෙනුවෙන් **සිල්වා** සමග ගනුදෙනු කරන ලදී. **රෝස්** සමග එළඹෙන ලද ගිවිසුමකින් **සිල්වා** ට සැළකිය යුතු පාඩුවක් දැරීමට සිදුවූ අතර, **රෝස්ගේ** නියෝජිතභාවය අවසන් කිරීමෙන් පසු එම ගිවිසුම සඳහා එළඹී තිබුණි. එම ගිවිසුමෙන් සිදුවූ පාඩුව සම්බන්ධයෙන් **සිල්වා, කුමාර්ගෙන්** වන්දි ඉල්ලා සිටින ලදී.

(a) නියෝජ්‍යත්ව නීතිය යටතේ **කුමාර්ගෙන්** වන්දි ලබාගැනීම සඳහා හිමිකම් පෑමට **සිල්වාට** හැකිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) නියෝජිතයෙකුගේ යුතුකම් (duties) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

(a) 2016 ජනවාරි 02 දින තැපැල් කරන ලද ලිපියක් මගින් **A** තම මෝටර් රථය **B** හට විකිණීමට අර්පණය කරන ලදී. තැපෑලේදී සිදුවූ ප්‍රමාදයක් නිසා එම ලිපිය **B** ට ලැබුණේ 2016 ජනවාරි 10 දිනය. **B** විසින් මෝටර් රථය මිලදී ගැනීම ප්‍රතිග්‍රහණය කරන ලද තම ලිපිය 2016 ජනවාරි 13 වන දින තැපැල් කළ නමුත්, වැරදි දිශාවක පිහිටි සමාන ලිපිනයකට එම ලිපිය බාරදී තිබුණි.

ලිපිය ලද තැනැත්තා එය ළඟම තිබූ තැපැල් කාර්යාලයට 2016 ජනවාරි 20 දින බාර දී තිබූ අතර, තැපැල් දෙපාර්තමේන්තුව විසින් එය ලැබිය යුතු නිවැරදි තැනැත්තාට (එනම් **A** ට) 2016 ජනවාරි 30 දින එය නැවත බාරදී ඇත. ඒ අතරතුර, **B** ගේ ප්‍රතිගහණය පිළිබඳව සාධාරණ කාලසීමාවක් තුළ **A** වෙත ප්‍රතිචාරයක් නොලැබුණ බැවින්, **A** විසින් **B** වෙත අහෝසි කිරීමේ ලිපියක් (letter of revocation) 2016 ජනවාරි 15 දින තැපැල් කර 2016 ජනවාරි 16 දින තම මෝටර් රථය **C** හට විකුණන ලදී. කෙසේවෙතත්, මෙම අහෝසි කිරීමේ ලිපිය **B** වෙත ලැබුණේ 2016 ජනවාරි 18 දිනය. **B,** ඊට අදාල අර්පණය ප්‍රතිග්‍රහණය කර තිබුණේය යන මතයේ පිහිටා සිට ඔහු විසින් එය මිලදී ගැනීමට අපේක්ෂා කරන ලදී.

මේ සම්බන්ධයෙන් **B** ගේ නෛතික හිමිකම (legal right) **විමසන්න**. (ලකුණු 12)

(b) **නිමල්** ගේ ගබඩාවේ (warehouse) ගබඩාකර තිබූ පරිගණක තොගයෙන් පරිගණක 100 ක් විකිණීමට 2016 මාර්තු 01 වන දින **නිමල්** විසින් **කමල්** සමග ගිවිසුමකට එළඹෙන ලදී. ගිවිසුමට එළඹුණු අවස්ථාවේදී, ගබඩාවේ ගබඩාකර තිබූ සෙසු පරිගණක තොගයෙන්, පරිගණක 100 වෙන් නොකිරීමට එකඟ වන ලදී. මුළු පරිගණක තොගය **නිමල්** විසින් ආනයනය කර තිබුණේ 2016 පෙබරවාරි 20 දිනය. **කමල්** ට අයිතිය පැවරෙන අවස්ථාව පිළිබඳ කොන්දේසි කිසිවක් ගිවිසුමේ ඇතුලත් නොවීය. කෙසේවුවත් ගිවිසුමට එළඹීමෙන් පසුව **කමල්** විසින් **නිමල්** ව අමතා ඔහුගේ පරිගණක 100 වෙනම ගබඩාකොට තබන ලෙස උපදෙස් දුන් අතර, **නිමල්** විසින් එම උපදෙස් පරිදි ඒවා ගබඩා කර තබන ලදී. එසේ වුවත්, 2016 මාර්තු 02 වන දින එම පරිගණක 100 ද ඇතුළුව මුළු ගබඩාවම ගංවතුරෙන් විනාශ විය. ගංවතුරෙන් සිදුවූ හානියට එරෙහිව රක්ෂණ ආවරණයක් **නිමල්** හට නොතිබුණි. පරිගණක 100 ට අදාල පාඩුව **කමල්** විසින් දැරිය යුතු යැයි **නිමල්** විසින් තර්ක කරන ලදී.

පරිගණක 100 ට අදාල පාඩුව **කමල්** විසින් දැරිය යුතුදැයි **විමසන්න**. (ලකුණු 13)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |